සිද්ධාර්ථ ජ්‍යොතිශ්‍ය අස්පුව

ඔබේ අනාගත සුබ අසුබ සත්‍ය ලෙස දැනගැනීමට ජන්ම පත්‍රය පරීක්ෂාකර බලාගන්න.

උපන් වේලාව අනුව කේන්දරය සාදා ගැනීම

නමට අකුරු, ගති ගුණ, අධ්‍යාපනය, ක්‍රීඩා හා දක්ෂතා, වාසනා යෝග, රෝග ලක්ෂණ, විවාහය, රැකියාව, දරුපල, දේපල වාසනාව, ලොතරැයි හා හදිසි ධන ලාභ, හදිසි අනතුරු, ලාභ අලාභ, පවුලේ සමගිය, ආගම ධර්මයට ලැදි වීම, දුක හා සැප, ආයුෂ හා විශ්‍රාමික ජීවිතය, අපල සඳහා උපදෙස්, ඇතුලු සියලු පලා පල විස්තර සවිස්තරව දැනගන්න.

පොරොන්දම් බැලීම

ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේ ගැලපීම, දශා කාලය, දියුණුව, දරුපල, සතුට හා සමගිය, නොගැලපෙන දෝෂ, කුජදෝෂ හා අපල. කළ යුතු ප්‍රතිකර්ම හා උපදෙස් දැනගන්න.

නිවාස හා වෙළඳ කටයුතු සඳහා ඉතා වාසනාවන්ත ශුභ නැකත් පිළියෙළ කිරීම

නිවසට ගෙවිදීම, නිවාස ආරක්ෂාව, භෛරව පූජා, ආරක්ෂා විධි, දියුණුව හා දෝෂ සඳහා ප්‍රතිකර්ම.

මංගල නැකත්

සම්පූර්ණ මංගල නැකත් විස්තර, නිවසින් පිටවීම, විවාහයට අත්සන් කිරීම, මුදු මාල පළඳවා පෝරුවේ කටයුතු හා උත්සව සඳහා වාසනා නැකත්.

දරුවන්ට ශුභ නැකත්

දරුවාට අකුරු කියවීම, ප්‍රථම ඉඳුල් කටගෑම, කන් විදීම, ප්‍රථම පාසල් ප්‍රවේශයට විශේෂ නැකත්, විභාග සඳහා ප්‍රවේශය, රැකියාවට නැකත්.

මල්වර නැකත් හා පලාපල විස්තර.

දරුවන්ගේ අධ්‍යාපන දියුණුවට සරස්වතී පූජා හා සරස්වතී යන්ත්‍ර පැළඳීම.

කුජ මංගල දෝෂ හා ශනි ඊර්ෂ්‍යක අපල දුරලීම පිණිස ග්‍රහ පූජා හා බලගතු යන්ත්‍ර පැළඳීම.

දරුණු රෝග, හදිසි අනතුරු, අලාභ හා නින්දා, රැකියා ප්‍රශ්ණ සඳහා විශේෂ පුද පූජා හා බලගතු තෙල්වගී හා ආරක්ෂා විධි.

සියලුම නවග්‍රහ අපල සඳහා යන්ත්‍ර හා මැණික් මුදු වර්ග

වසර 35ක දේශීය හා විදේශීය පළපුරුදු ආයුර්වේද වෛද්‍ය විශේෂඥ, ජ්‍යොතිශ්‍ය විශාරද දේශාභිමානී, දේශබන්දු ආයුර්වේද හා ජ්‍යොතිශ්‍ය චක්‍රවර්ති නාමලාභී.

ආයුර්වේද වෛද්‍ය ස්ටැන්ලි ධර්මකුමාර

B A M S (Sri Lanka)AAA, FAA (Australia) AFA (USA) AL (UK) C A A C (Canada)

0435 006 912, 0403 730 098

Email - siddarthaoz@hotmail.com

www.astrologycentre.com.au



# අන්දරේ

**මහින්ද ගුණවර්ධන.**

රජතුමාටත් එක එක දේවල් හිතෙනවා නෙ. එතුමා කවියෙක්. රසවතෙක්. දවසක් අන්දරේට නියෝගයක් දුන්නා. රජ අණට අනුව අන්දරේ ගමේ ගොඩේ හැම තැනක ම ඇවිදින්න ඕන. බිරින්දෑට බය මිනිසුන් ඉන්න ගෙවල්වලින් එක හරකා බැගින් ගේන්න ඕන.

අන්දරේට ඒක ගෙවල් ගානේ ඇවිදින්නට දීපු බලපත්‍රයක් වගෙයි. අන්දරේ බොහොම කැමැත්තෙන්, උජාරුවෙන් ගෙයක් ගෙයක් ගානේ ගියා. හොඳට හොයලා බැලුවා.

"තමුසෙ පස්ස පැත්තට ඉර වැටෙනකම් නිදාගෙන ඉඳලා හරියනව ද?" ගෑනියෙක් කෑ ගහන සද්දේ ඇහුණා.

"මං හරකා ලිහාගෙන යනවෝ. මේක රජ අණ." පිළිකන්න පැත්තෙන් අන්දරේ පිළිතුරු දුන්නා.

ගෘහනිය ගෙයින් එළියට එනවිට, අන්දරේ හරකා දක්කගෙන කඩුල්ල ළඟටත් ගිහින් ඉවරයි.

මේ විදියට අන්දරේ ගෙවල් ගානේ ගියා. දිය රෙදි ඇඳගෙන නාමින් සිටින කාන්තාවන් ඉන්න ඉසව්වේ ද කිසි ම බයක් හැකක් නැතිව ඇවිද්දා. තහනමක් නෑ. කට සැර උන්දැලා කව්දැ කාගේ හරි කටින් පිරිමියාට විරුද්ධ ව එක වචනයක් පිට වුණොත් අන්දරේ ඔහුට අයිති හරකෙක් පවරා ගන්නවා. කඩ තිබෙන ඉසව්වේත් ඇවිද්දා. ගෑනිට බය වගන්තියක් හරි කියවෙනවා ඇහුණොත් ඒත් හරකා අයිති කර ගන්නට අන්දරේට බලය තිබෙනවා.

දවස් කිහිපයකට පස්සේ අන්දරේ හරක් රංචුවක් ම දක්කාගෙන රජවාසලට ගියා. රජතුමාට බෙහෙවින් සතුටුයි. ඒ විතරක් යැ. ලොකු ආශ්වාදයකුත් ලැබුණා.

"මොනවද බං ගම් පළාතේ තොරතුරු?"

"රජතුමනි, ගම්වල නෙ නියම ගෙවල් තියෙන්නේ. හැබෑ ම රූප සුන්දරියො ඉන්නෙ ගමේ නේන්නම්. රන් තැඹිලි ගෙඩි වාගේ ඉස්සරහට නෙරලා, කොස් ගෙඩි වගේ පස්ස ආරලා, එහෙ බැලුවත් හැඩයි., මෙහෙ බැලුවත් හැඩයි., මුහුණු දැක්කා ම බලාගෙන ම ඉන්න හිතෙනවා ..." අන්දරේ මහ හයියෙන් විස්තර කරනවා.

"අන්දරේ ... කට ... කට ... බිසවට ඇහුණොතින් මටත් විසුමක් වෙන්නෙ නෑ." රජතුමා වටපිට බලමින් කිව්වා.

අන්දරේගේ කට පැත්තකට ඇද වුණා.

"රජතුමනි, ඔබ වහන්සේගෙනුත් හරකෙක් ඕනෑ මේ ගොඩට. හැබැයි ඒකාට නම් විශේෂ සැලකිලි දක්වන්න කියලා රාජ පුරුෂයින්ට කියන්න වෙයි නේද?"

අන්දරේ ඇඟට පතට නො දැනීම කිව්වා.

රජතුමාටත් එක එක දේවල් හිතෙනවා නෙ. එතුමා කවියෙක්. රසවතෙක්. දවසක් අන්දරේට නියෝගයක් දුන්නා. රජ අණට අනුව අන්දරේ ගමේ ගොඩේ හැම තැනක ම ඇවිදින්න ඕන. බිරින්දෑට බය මිනිසුන් ඉන්න ගෙවල්වලින් එක හරකා බැගින් ගේන්න ඕන.

අන්දරේට ඒක ගෙවල් ගානේ ඇවිදින්නට දීපු බලපත්‍රයක් වගෙයි. අන්දරේ බොහොම කැමැත්තෙන්, උජාරුවෙන් ගෙයක් ගෙයක් ගානේ ගියා. හොඳට හොයලා බැලුවා.

"තමුසෙ පස්ස පැත්තට ඉර වැටෙනකම් නිදාගෙන ඉඳලා හරියනව ද?" ගෑනියෙක් කෑ ගහන සද්දේ ඇහුණා.

"මං හරකා ලිහාගෙන යනවෝ. මේක රජ අණ." පිළිකන්න පැත්තෙන් අන්දරේ පිළිතුරු දුන්නා.

ගෘහනිය ගෙයින් එළියට එනවිට, අන්දරේ හරකා දක්කගෙන කඩුල්ල ළඟටත් ගිහින් ඉවරයි.

මේ විදියට අන්දරේ ගෙවල් ගානේ ගියා. දිය රෙදි ඇඳගෙන නාමින් සිටින කාන්තාවන් ඉන්න ඉසව්වේ ද කිසි ම බයක් හැකක් නැතිව ඇවිද්දා. තහනමක් නෑ. කට සැර උන්දැලා කව්දැ කාගේ හරි කටින් පිරිමියාට විරුද්ධ ව එක වචනයක් පිට වුණොත් අන්දරේ ඔහුට අයිති හරකෙක් පවරා ගන්නවා. කඩ තිබෙන ඉසව්වේත් ඇවිද්දා. ගෑනිට බය වගන්තියක් හරි කියවෙනවා ඇහුණොත් ඒත් හරකා අයිති කර ගන්නට අන්දරේට බලය තිබෙනවා.

දවස් කිහිපයකට පස්සේ අන්දරේ හරක් රංචුවක් ම දක්කාගෙන රජවාසලට ගියා. රජතුමාට බෙහෙවින් සතුටුයි. ඒ විතරක් යැ. ලොකු ආශ්වාදයකුත් ලැබුණා.

"මොනවද බං ගම් පළාතේ තොරතුරු?"

"රජතුමනි, ගම්වල නෙ නියම ගෙවල් තියෙන්නේ. හැබෑ ම රූප සුන්දරියො ඉන්නෙ ගමේ නේන්නම්. රන් තැඹිලි ගෙඩි වාගේ ඉස්සරහට නෙරලා, කොස් ගෙඩි වගේ පස්ස ආරලා, එහෙ බැලුවත් හැඩයි., මෙහෙ බැලු-වත් හැඩයි., මුහුණු දැක්කා ම බලාගෙන ම ඉන්න හිතෙනවා ..." අන්දරේ මහ හයියෙන් විස්තර කරනවා.

"අන්දරේ ... කට ... කට ... බිසවට ඇහුණොතින් මටත් විසුමක් වෙන්නෙ නෑ." රජතුමා වටපිට බලමින් කිව්වා.

අන්දරේගේ කට පැත්තකට ඇද වුණා.

"රජතුමනි, ඔබ වහන්සේගෙනුත් හරකෙක් ඕනෑ මේ ගොඩට. හැබැයි ඒකාට නම් විශේෂ සැලකිලි දක්වන්න කියලා රාජ පුරුෂයින්ට කියන්න වෙයි නේද?"

අන්දරේ ඇඟට පතට නො දැනීම කිව්වා.

